# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/35—1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා—1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලේ)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (70)/76.

### (40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥපනත

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වන දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

### නියෝග

1. මෙ නියෝග හදිසි අවස්ථා (පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවන්ට පාරිතෝෂික හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීමෙ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මෙ නියෝගවල කාර්යය සඳහා කොමසාරිස්වරයා නියම බලධරයා වන්නේ ය.

(2) මෙ නියෝගවලින් නියම බලධරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලයක්, කටයුත්තක් හෝ කාර්යයක් කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත එම බලධරයා විසින් පවරනු ලැබිය හැකි ය.

3. වෙන යම් ලිඛිත නීතියක හෝ වාචික, ලිඛිත, ප්‍රකාශිත හෝ ගම්‍යමාන යම් සේවා ගිවිසුමක කුමක් සඳහන්ව ඇත ද මෙ නියෝගවල විධිවිධාන බලංගුව බලාත්මක විය යුතු අතර, ඒ අනුව මේ නියෝගවල විධිවිධාන හා ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම හා අතර යම් ගැටීමක් හෝ නොගැලපීමක් ඇති වුවහොත් ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම අභිබවා මෙ නියෝගවල විධිවිධාන බලපැවැත්විය යුතුය.

4. (1) පෙරළා සිය රට යවනු ලබන ඉන්දියානුවකු යම් වත්තක කම්කරුවකු වශයෙන් අවුරුදු පහකට නොඅඩු කාලයක් සේවයෙහි නියුක්ත කර ගත් සෑම සේවායෝජකයෙකු ම විසින් ඒ පෙරළා සිය රට යවනු ලබන්නාට කම්කරුවකු වශයෙන් වූ ඔහුගේ සේවය වෙනුවෙන් මෙහි උපලේඛනයෙහි දක්වා ඇති ප්‍රමාණය අනුව ආගණනය කරන ලද පාරිතෝෂිකයක් ගෙවනු ලැබිය යුතුය.

(2) පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකු යම් වත්තක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් අවුරුදු පහකට නොඅඩු කාලයක් සේවයෙහි නියුක්ත කර ගත් සෑම සේවායෝජකයකු ම විසින් ඒ පෙරළා සියරට යවනු ලබන්නාට කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් වූ ඔහුගේ සේවය වෙනුවෙන් මෙහි උපලේඛනයෙහි දක්වා ඇති ප්‍රමාණය අනුව ආගණනය කරන ලද පාරිතෝෂිකයක් ගෙවනු ලැබිය යුතුය.

(3) මෙ නියෝග ක්‍රියාත්මක වන දින හෝ එදිනට පෙර එවැනි සේවායෝජකයෙකු විසින් එකී සේවාවන් වෙනුවෙන් පාරිතෝෂිකයක් ගෙවනු ලැබ ඇති පෙරළා සිය රට යවනු ලබන ඉන්දියානුවකුට හෝ පෙරළා සිය රට යවනු ලබන ඉන්දියානුවකු සම්බන්ධයෙන් හෝ මේ නියෝගයේ (1) වන හා (2) වන ඡෙදවල විධිවිධාන අදළ නොවන්නේ ය.

(4) මෙ නියෝගයේ ඉහතින් වූ විධිවිධාන යටතේ පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට ලැබිය යුතු යම් පාරිතෝෂික ගෙවීමක් ලබා ගැනීමට පෙර ඒ පෙරළා සියරට යවනු ලබන්නා මිය ගියහොත්, ඒ පෙරළා සියරට යවනු ලබන්නා සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයකුව සිටියේ නම් සේවක අර්ථසාධක අරමුදල් පනතේ 24 වන වගන්තියෙහි සඳහන් මුදල එම වගන්තිය යටතේ ලැබීමට හිමිකම් ලැබෙන්නට තිබුණු තැනැත්තාට හෝ තැනැත්තන්ට හෝ ඒ ගෙවීම කරනු ලැබිය යුතු ය.

5. (1) යම් වත්තක සේවයේ නියුක්ත කම්කරුවකු හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වන පෙරළා සිය රට යවනු ලබන ඉන්දියානුවකුට හෝ, ඔහු වෙනුවෙන්, ඔහු සාමාජිකත්වය දරන වෘත්තීය සමිතියකට හෝ, පාරිතෝෂික හෝ වෙනත් ප්‍රතිලාභ ගෙවීම සම්බන්ධයෙන් පිහිටක් හෝ සහනයක් සඳහා කාර්මික ආරාවුල් පනතේ 31ආ (1) (ආ) වන වගන්තිය යටතේ ඉල්ලීමක් කිරීමේ හිමිකම නොමැත්තේ ය.

(2) යම් වත්තක සේවයේ නියුක්ත කම්කරුවකු හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වන පෙරළා සිය රට යවනු ලබන ඉන්දියානුවකු විසින් හෝ, ඔහු වෙනුවෙන්, ඔහු සාමාජිකත්වය දරන වෘත්තීය සමිතියක් විසින් හෝ, මෙ නියෝග ක්‍රියාත්මක වන දින හෝ එදිනට පෙර පාරිතෝෂික හෝ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීම සම්බන්ධයෙන්, කාර්මික ආරාවුල් පනතේ 31ආ (1) (ආ) වන වගන්තිය යටතේ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත කරනු ලබන සෑම ඉල්ලීමක් ම එම ඉල්ලීම මත තීරණයක් කිරීමට පෙර ඕනෑම අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි එම පෙරළා සිය රට යවනු ලබන්නා විසින් හෝ ඔහු සාමාජිකත්වය දරන වෘත්තීය සමිතිය විසින් හෝ මෝසමක් මගින් ඉල්ලා අස්කරගත හැකි අතර ඒ විනිශ්චය අධිකාරය විසින් එම මෝසමට ඉඩ දෙමින් ආඥවක් කළ යුතුය.

(3) ඉල්ලීමක් ඉල්ලා අස්කර ගැනීම සඳහා වූ මෝසමකට ඉඩ දෙමින් 2 වන ඡෙදය යටතේ ආඥවක් කර තිබෙන අවස්ථාවක, කම්කරු විනිශ්චය අධිකාරය වෙත ඒ ඉල්ලීම කරනු ලැබුවේ යම් පෙරළා සිය රට යවනු ලබන ඉන්දියානුවකු සම්බන්ධයෙන් ද ඒ පෙරළා සිය රට යවනු ලබන ඉන්දියානුවා සම්බන්ධයෙන්, පාරිතෝෂික සහ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීමට අදළ, මෙ නියෝගවල විධිවිධාන අදළ වන්නේ ය ; තව ද ඒ ආඥව ඒ පෙරළා සිය රට යවනු ලබන්නාට ලැබිය යුතු පාරිතෝෂික සහ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය සේවායෝජක විසින් එකී ආඥවේ දිනයෙහි සිට සති දෙකක් ඇතුළත ඔහු වෙත දනුම් දිය යුතුය.

81A——ජ 24279 — 2,100 (76/12)

6. මේ නියෝගවල 4 වන නියෝගය අදාළ වන පෙරළා සිය රට යවනු ලබන ඉන්දියානුවකුගේ සෑම සේවායෝජකයෙකුම විසින්—

(අ) ඒ පෙරළා සිය රට යවනු ලබන ඉන්දියානුවාට සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ලැබිය යුතු ප්‍රතිලාභ ගෙවීම සඳහා සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 23 වන වගන්තිය යටතේ ඒ සේවායෝජකයා විසින් හිමිකම පෑමක් සහතික කරනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත නැතහොත් ඒ පෙරළා සිය රට යවනු ලබන ඉන්දියානුවා විසින් ඒ හිමිකම් පෑම හෝ ප්‍රතිලාභ මේ නියෝග ක්‍රියාත්මක වන දිනයෙහි හෝ ඒ දිනට කලින් කර තිබෙන හෝ ලබා තිබෙන අවස්ථාවක, මේ නියෝග ක්‍රියාත්මක වන දින සිට සති දෙකක් ඇතුළත ඒ පෙරළා සිය රට යවනු ලබන්නාට ලැබිය යුතු පාරිතෝෂික හා වෙනත් මුල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණයන් දැනුම් දිය යුතුය ; තව ද

(ආ) ඒ පෙරළා සිය රට යවනු ලබන්නාට ලැබියයුතු පාරිතෝෂික සහ වෙනත් මුල්‍ය ප්‍රතිලාභ, තමාගේ වත්කම හෝ තම පවුලේ වත්කම් පැවරීම සඳහා ඔහු විසින් විනිමය පාලකගෙන් ලත් බලපත්‍රයක් ඉදිරිපත් කරනු ලබන දිනයෙහි සිට සති දෙකක් ඇතුළත දී ඔහුට ගෙවනු ලැබිය යුතුය.

7. (1) " අත්තිකාරම් ගිණුම් අරමුදල " යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලබන අතර එම අරමුදලට—

(අ) මේ නියෝගවල කාර්යයන් සඳහා එම අරමුදලට ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලබන මුදල් කිසිවක් ; සහ

(ආ) මේ නියෝගවල විධිවිධාන යටතේ තේ පාලකගෙන් සහ රබර් පාලකගෙන් කොමසාරිස්වරයා වෙත ලැබෙන මුදල් කිසිවක් ද ගෙවනු ලැබිය යුතුය.

(2) අත්තිකාරම් ගිණුම් අරමුදලේ පාලනය සම්බන්ධයෙන් කොමසාරිස්වරයා වගකිව යුතුය.

8. (1) පාරිතෝෂික හෝ වෙනත් මුල්‍ය ප්‍රතිලාභ ගෙවනු ලැබීම සඳහා, පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකු විසින් හෝ ඔහු වෙනුවෙන් වෘත්තීය සමිතියක් විසින් හෝ ඉල්ලීමක් කරනු ලැබූ විට, අවශ්‍ය යයි කොමසාරිස්වරයා සලකන විභාග කිරීමෙන් පසු, යම් පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට ලැබිය යුතු පාරිතෝෂික හෝ වෙනත් මුල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය, මේ නියෝගවලින් නියමකොට ඇති පරිදි, ඒ පෙරළා සිය රට යවනු ලබන ඉන්දියානුවාට දැනුම් දීම යම් සේවායෝජකයකු විසින් පැහැර හැර ඇති හෝ ප්‍රතික්ෂේප කර ඇති බවට, නැතහොත් වැරදි ප්‍රමාණයක් දැනුම් දී ඇති බව කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක කොමසාරිස්වරයා විසින් ඒ පෙරළා සිය රට යවනු ලබන්නාට ඒ සේවායෝජකයාගෙන් ලැබිය යුතු පාරිතෝෂික හා වෙනත් මුල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය සඳහන් කරමින් සහතිකයක් නිකුත් කළ යුතුය. ඒ සහතිකයේ පිටපතක් ඒ පෙරළා සිය රට යවනු ලබන්නා වෙත සහ ඔහුගේ සේවායෝජකයා වෙත තැපෑලෙන් යවනු ලැබිය යුතුය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයෙහි ඇතුළත් යම් ප්‍රකාශයක නිරවද්‍යතාව අවසානාත්මක හා තීරණාත්මක වන අතර රිට් ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ කිසිම අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී හෝ එය ප්‍රශ්න කරනු නොලැබිය යුතුය.

(3) මේ නියෝග යටතේ හෝ මේ නියෝගවලින් නියමකොට ඇති පරිදි යම් පෙරළා සිය රට යවනු ලබන ඉන්දියානුවකුට ලැබිය යුතු පාරිතෝෂික හා වෙනත් මුල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය ගෙවීම යම් සේවායෝජකයෙකු විසින් පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, ඒ පාරිතෝෂික හා වෙනත් මුල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය අත්තිකාරම් ගිණුම් අරමුදලින් එම පෙරළා සියරට යවනු ලබන්නාට ගෙවීමේ ද ඒ පෙරළා සියරට යවනු ලබන්නාගේ සේවායෝජකයාට සහ අවස්ථාවෝචිත පරිදි තේ පාලකට හෝ රබර් පාලකට ඒ ගෙවීම් දැනුම් දීමේ ද බලය කොමසාරිස්වරයාට ඇත්තේ ය.

(4) මේ නියෝගයේ (3) වන ඡේදය යටතේ යම් පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට කොමසාරිස්වරයා විසින් අත්තිකාරම් ගිණුම් අරමුදලින් යම් ගෙවීමක් කරනු ලබන අවස්ථාවක, ඒ පෙරළා සියරට යවනු ලබන්නාට කොමසාරිස්වරයා විසින් එසේ ගෙවන ලද මුදලින් සියයට පණහක් නොඉක්ම වන්නා වූ කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන මුදලක අධිභාරයක් ඒ ගෙවීම වෙනුවෙන් කොමසාරිස්වරයා වෙත ගෙවීමට ඒ පෙරළා සිය රට යවනු ලබන්නාගේ සේවායෝජකයා යටත් වන්නේ ය.

(5) මේ නියෝගයේ (3) වන ඡේදය යටතේ යම් පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට කොමසාරිස්වරයා විසින් යම් ගෙවීමක් කරනු ලබන අවස්ථාවක, ඒ ගෙවීම් සහ ඒ පෙරළා සිය රට යවනු ලබන්නාගේ සේවායෝජකයා විසින් ඒ ගෙවීම වෙනුවෙන් ගෙවනු ලැබිය යුතු අධිභාරය ඒ සේවායෝජකයාට සහ අවස්ථාවෝචිත පරිදි තේ පාලකට සහ රබර් පාලකට කොමසාරිස්වරයා විසින් දැනුම් දිය යුතු ය.

(6) මේ නියෝගයේ (5) වන ඡේදය යටතේ වූ දැනුම් දීමක් කොමසාරිස්වරයාගෙන් ලැබුන අවස්ථාවක, පෙරළා සිය රට යවනු ලබන ඉන්දියානුවකුට පාරිතෝෂික වශයෙන් ගෙවන ලද මුදල ලෙස ද ඒ මත ගෙවනු ලැබිය යුතු අධිභාරය ලෙස ද ඒ නිවේදනයෙහි සඳහන් මුදල් ප්‍රමාණයන්, ඒ පෙරළා සියරට යවනු ලබන්නාගේ සේවායෝජකයාට අවස්ථාවෝචිත පරිදි තේ සහනාධාර අරමුදල යටතේ නැතහොත් රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදල යටතේ ගෙවනු ලැබිය යුතු යම් මුදලකින් කොමසාරිස්වරයාට ගෙවීමේ බලය අවස්ථාවෝචිත පරිදි තේ පාලකට හෝ රබර් පාලකට හෝ ඇත්තේ ය.

9. (1) පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකු සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටි වත්තක් ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කරනු ලැබ ඇති හෝ ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලැබ ඇති හෝ අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් තමා අවශ්‍ය යයි සලකන විභාගයකින් පසු, ඒ සතුකර ගැනීමේ හෝ අත්කර ගැනීමේ දිනයට පෙර ඒ සේවායෝජකයා යටතේ වූ ස්වකීය සේවය වෙනුවෙන් ඒ පෙරළා සියරට යවනු ලබන්නාට ඒ සේවායෝජකයාගෙන් ලැබිය යුතු පාරිතෝෂික සහ වෙනත් මුල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය සඳහන් කරමින් සහතිකයක් නිකුත් කළ යුතුය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරනලද සහතිකයෙහි ඇතුළත් යම් ප්‍රකාශයක නිරවද්‍යතාව අවසානාත්මක හා තීරණාත්මක වන අතර රිට් ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ කිසිම අධිකරණයක දී හෝ විනිශ්චය අධිකරණයක දී එය ප්‍රශ්න කරනු නොලැබිය යුතුය.

(3) පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට ඔහුගේ සේවායෝජකයාගෙන් ලැබිය යුතු මුදල සඳහන් කරමින් මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ සහතිකයක් කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන අවස්ථාවක, ඒ පෙරළා සියරට යවනු ලබන්නා විසින් සිය වත්කම හෝ සිය පවුලේ වත්කම් පැවරීම සඳහා විනිමය පාලකගෙන් බලපත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ පසුව, අවස්ථාවෝචිත පරිදි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් නැතහොත් අත්කර ගැනීමේ නිලධරයා විසින්, කොමසාරිස්වරයා මගින්, එසේ සහතික කරනු ලැබ තිබිය හැකි මුදල ඒ පෙරළා සිය රට යවනු ලබන්නාට ගෙවනු ලැබිය යුතුය.

(4) මේ නියෝගයේ (1) වන ඡේදයෙහි සඳහන් සහතිකයෙහි පිටපතක්, ඒ සහතිකය නිකුත් කරනු ලැබුයේ යම් පෙරළා සියරට යවනු ලබන්නකු සම්බන්ධයෙන් ද ඒ පෙරළා සියරට යවනු ලබන්නාගේ සේවායෝජක වෙත කොමසාරිස්වරයා විසින් යවනු ලැබිය යුතුය.

(5) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් හෝ අත්කර ගැනීමේ නිලධරයා විසින් පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට, මේ නියෝගයේ විධිවිධාන යටතේ ගෙවන ලද යම් මුදලක්, ඒ පෙරළා සියරට යවනු ලබන්නාගේ සේවායෝජකයා වෙත අවස්ථාවෝචිත පරිදි ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 31 වන වගන්තිය යටතේ හෝ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 17 වන වගන්තිය යටතේ හෝ ගෙවනු ලැබිය යුතු වන්දි මුදල කෙරෙහි ප්‍රථම වැය බරක් විය යුතු අතර ඒ මුදල, ඒ සේවායෝජකයා වෙත ප්‍රදානය කරනු ලබන වන්දි මුදලේ ප්‍රමාණයෙන් අඩුකර ගත යුතුය.

10. නියම බලධරයාට—

(අ) පෙරළා සිය රට යවනු ලබන ඉන්දියානුවන්ට අදාළ යම් නාම ලේඛනයක් හෝ වාර්තාවක් පරීක්ෂා කිරීමේ හෝ මේ නියෝගවල විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබේ දැයි නිශ්චය වශයෙන් දැන ගැනීමේ කාර්යය සඳහා පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවන් සේවයේ නියුක්ත කරනු ලැබ සිටින යම් වත්තකට දවල් හෝ රාත්‍රී කාලයේ සියලු යුක්තිසහගත වේලාවන්හි දී ඇතුළු ව ඒ වත්ත පරීක්ෂා කිරීමේ ද ;

(ආ) තමා ඒ ස්ථානය පරීක්ෂා කරන විට එවැනි යම් වාර්තාවක් හෝ නාමලේඛනයක් පරීක්ෂණය සඳහා නොමැති අවස්ථාවක, නිශ්චය කරනු ලබන යම් පසු දිනයක ඒ ස්ථානයේදී ම හෝ බලධරයාගේ කාර්යාලයේ දී හෝ, පරීක්ෂණය සඳහා එම ලේඛනය හෝ වාර්තාව ඉදිරිපත් කරන ලෙස නියම කිරීමේ ද ;

(ඇ) මේ නියෝග යටතේ වූ තම බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා තමාට අවශ්‍ය වන සියලු තොරතුරු, සපයන ලෙස සේවායෝජකයාට නියම කිරීමේ ද එසේ ඉල්ලූ විට ඒ අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ යුතුකම වන්නේ ය ;

(ඈ) නාමලේඛනයක හෝ වාර්තාවක හෝ සම්පූර්ණ පිටපතක් හෝ එහි යම් කොටසක පිටපත් ගැනීමේ ; සහ

(ඉ) මේ නියෝග බලගැන්වීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි තමා සලකන විමසීම් කිරීමේ ද

බලය ඇත්තේ ය.

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ නියෝගවල—

" අත්කර ගැනීමේ නිලධරයා " යන්නෙහි (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතෙහි ඒ සඳහා දී ඇති අර්ථය ම ඇත්තේය.

" කොමසාරිස්වරයා " යන්නෙන් තත් කාලයෙහි කම්කරු කොමසාරිස් ධුරය දරන තැනැත්තා අදහස් වන අතර—

(අ) මේ නියෝගවල 8 වන සහ 9 වන නියෝග නොවන නියෝග යටතේ කොමසාරිස්වරයා සතු යම් බලයක්, කාර්යයක් හෝ කටයුත්තක් සම්බන්ධයෙන් වූ විට, ඒ බලය ක්‍රියාත්මක කිරීමට, ඒ කාර්යය ඉටුකිරීමට හෝ ඒ කටයුත්ත කිරීමට කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් ද,

(ආ) මේ නියෝගවල 8 වන සහ 9 වන නියෝගවලින් කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බලතල සම්බන්ධයෙන් වූ, තත් කාලයෙහි නියෝජ්‍ය හෝ ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර කම්කරු කොමසාරිස් ධුරය දරන්නා වූ යම් තැනැත්තෙක් හෝ යම් කම්කරු නිලධාරියෙක් ද,

එයට ඇතුළත් වෙති.

" සේවක අර්ථසාධක අරමුදල " යන්නෙහි 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි ඒ සඳහා දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

" සේවක අර්ථසාධක අරමුදල් පනත " යන්නෙන් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත අදහස් වේ ;

" සේවායෝජකයා " යන්නෙන්—

(අ) යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කර ගන්නා යම් තැනැත්තෙක් හෝ, යම් තැනැත්තෙක් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කර ගන්නේ වෙන යම් කිසි තැනැත්තෙකු වෙනුවෙන්ද ඒ වෙන තැනැත්තා ; හෝ

(ආ) වෙන යම් තැනැත්තෙකු වෙනුවෙන් යම් කම්කරුවකු සේවයේ නියුක්ත කර ගන්නා යම් තැනැත්තකු,

අදහස්වන අතර, සේවායෝජක මණ්ඩලයක් (ඒ මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක්, සමාගමක්, සංස්ථාවක් හෝ වෘත්තීය සමිතියක් වුවද) සහ සේවායෝජකයෙකුව සිටීම අවසන් කළ යම් තැනැත්තෙක් හෝ සේවායෝජක මණ්ඩලයක් එයට ඇතුළත් වේ ;

" වත්ත " යන්නෙහි (133 වන අධිකාරය වූ) වතු කම්කරු (ඉන්දියානු) ආඥපනතෙහි ඒ සඳහා දී ඇති අර්ථයම ඇත්තේ ය ;

" පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවා " යන්නෙන් 1964 ඉන්දු-ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු පුරවැසියකු වශයෙන් ඉන්දියානු ආණ්ඩුව විසින් පිළිගනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ ;

" කාර්මික ආරාවුල් පනත " යන්නෙන් (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනත අදහස් වේ ;

" කම්කරුවා " යන්නෙන් වතු කම්කරු නාමලේඛනයක නම් දක්වෙන (සාමාන්‍යයෙන් ඉන්දියානු කුලීකරුවන් යනුවෙන් හඳුන්වනු ලබන) යම් කම්කරුවකු හෝ කන්ගානියකු අදහස් වන අතර සාමාන්‍යයෙන් " තුලුකන් " යනුවෙන් හඳුන්වනු ලබන මුස්ලිම්වරු හෝ කම්කරුවකුව සිටීම අවසන් කළ යම් තැනැත්තෙක් ද එයට ඇතුළත් වේ;

" කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු " යන්නෙන් කම්කරුවකු ලෙස නොව වෙනත් යම් තත්ත්වයකින් වත්තක සේවයේ නියුක්ත යම් තැනැත්තකු අදහස් වන අතර කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටීම අවසන් කළ යම් තැනැත්තකු ද ඊට ඇතුළත් වේ ;

" ඉඩම් අත්කර ගැනීමේ පනත " යන්නෙන් (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත අදහස් වේ ;

" ඉඩම් ප්‍රතිසංස්කරණ පනත " යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අදහස් වේ ;

" ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව " යන්නෙහි ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙහි ඒ සඳහා දී ඇති අර්ථය ම ඇත්තේය ;

" වෙනත් මූල්‍ය ප්‍රතිලාභ " යන්නට හිඟ වේතන මුදල්, අර්ථසාධක අරමුදලට ගෙවූ දායක මුදල් සහ වාර්ෂික නිවාඩු වේතන ඇතුළත් වේ ;

" රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදල " යන්නෙන් (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත මගින් පිහිටුවන ලද රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදල අදහස් වේ ; තව ද

" තේ සහනාධාර අරමුදල " යන්නෙන් 1958 අංක 12 දරන තේ සහනාධාර පනත මගින් පිහිටුවන ලද තේ සහනාධාර අරමුදල අදහස් වේ.

## උපලේඛනය

පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට මේ නියෝග යටතේ ගෙවිය යුතු පාරිතෝෂිකය පහත සඳහන් ප්‍රමාණයන් අනුව ආගණනය කළ යුතුය :—

(1) කම්කරුවන්ට අදාළ ප්‍රමාණයන්

(අ) සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීමට යටත්වීම ආරම්භ වීමට පෙර සේවයේ නියුක්තව සිටි එක් එක් වර්ෂය සඳහා—

(i) පිරිමියකුට — රු. 35.00
(ii) ස්ත්‍රියකට — රු. 30.00

(ආ) සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීමට යටත්වීම ආරම්භ වූ දින සිට 1970 දෙසැම්බර් මස 31 වන දිනය තෙක් සේවයේ නියුක්තව සිටි එක් එක් වර්ෂය සඳහා—

(i) පිරිමියකුට — රු. 17.50
(ii) ස්ත්‍රියකට — රු. 15.00

(2) කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට අදාළ ප්‍රමාණයන්

අවසාන වැටුප පදනම් කර ගෙන සේවයේ නියුක්තව සිටි එක් එක් වර්ෂය සඳහා එක් මසක දළ වැටුප, යම් අර්ථසාධක අරමුදලකට සේවායෝජකයාගේ දායක මුදල එයින් අඩුකර.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී